unit
02

වාගීෂ්වර

# දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය

s u r e k a   w a g e e s h w a r a

# දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය

ප්‍රවේශය

- දේශපාලන විද්‍යාව කෙටියෙන් හඳුන්වන්න.
- දේශපාලන විද්‍යාව සාමාජීය විද්‍යාවක් බව කෙටියෙන් දක්වන්න.
- දේශපාලන විද්‍යාව බිහිවූයේ කුමක් සඳහාදැයි දක්වන්න.
- දේශපාලනය යන පදයේ බිහිවීම දක්වන්න.
- ආදිකර්තෘ වරයා සහ විකාශනය වූ යුගය කෙටියෙන් දක්වන්න.

කරුණු

සාමාජීය විද්‍යාවක් වන දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය , විෂය පරිපථය , විෂය වපසරිය සම්බන්ධ **විශ්වීය . . . . , සර්වලෝකී . . . . , ඒකීයභාවයක් දක්නට නොමැත.** ඊට හේතු සාධක ලෙස දේශපාලන විද්‍යාව සාමාජීය විද්‍යාවක්වීම පෙන්වා දිය හැකිය. එම නිසා කාලීනව දේශපාලන විද්‍යාවේ විෂය කරුණු ගතිකයන්ට ලක්වන අයුරු දැකගතහැකිය.

නිදර්ශන — 1776 ට පූර්ව කාලසීමාව තුළ ආර්ථික විද්‍යා විෂය කරුණු දේශපාලන විද්‍යාව තුළ අඩංගු වුව ද 1776 පසුව ආර්ථික විද්‍යා විෂය කොටස් දේශපාලන විද්‍යාවෙන් ඉවත් කර ස්වාධීන විෂයයක් වශයෙන් වර්ධනය වීම.

නිදර්ශන — ගැටුම් අධ්‍යයනය හා නිරාකරණය චර්යාවාදීන් හරහා දේශපාලන ක්‍රියාදාමය වැනි නව විෂය කරුණු දේශපාලන විද්‍යාවට එකතුවීම.

- **දේශපාලන විද්‍යාඥයින් අතර පවා දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පොදු එකඟතාවයක් නොමැත.**

නිදර්ශන : ගිල් ක්‍රිස්ට් ට අනුව , **රාජ්‍ය පිළිබඳ හැදෑරීම** දේශපාලන විද්‍යාවේ විෂය පරිපථය වේ. මොහු තව දුරටත් විෂය ක්ෂේත්‍රයකට අදාල කරුණු හකුළුවා දක්වයි.

a අතීතයේ පැවති රාජ්‍ය ක්‍රම පිළිබඳ හැදෑරීම.
b වර්තමාන රාජ්‍යක්‍රම පිළිබඳ හැදෑරීම.
c රාජ්‍යයේ සැබෑ ස්වභාවය කුමක්දැයි යන්න හැදෑරීම.

නිදර්ශන : **ස්ටීවන් ලී කොක් , ඩොයිෂ් , කාල් ඩබ්ලිව්** ආදීහු **ආණ්ඩු ක්‍රම පමණක්** හැදෑරීම දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ වේ යයි මතක පළ කරයි.

නිදර්ශන : <u>හැරල්ඩ් ජේ. ලැස්කි , රේමන් ජී. ගෙට්ල්</u> ආදීන්ට අනුව රාජ්‍ය හා ආණ්ඩුව ගැන හැදෑරීම දේශපාලන විද්‍යාව විෂය ක්ෂේත්‍රයට අදාල වේ.

නිදර්ශන : <u>මැකියාවෙලී , තෝමස් හොබ්ස්</u> , ආදීහු පලකරන මතය වන්නේ , "දේශපාලන බලය" පිළිබඳ හැදෑරීම දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය බවයි.

නමුත්,

<u>දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය මාතෘකාව සංවාදය , කථිකාව බවට පත්වන්නේ රාජ්‍යය යි ( STATE ). රාජ්‍යය හා ඒ වටා නිර්මාණයවී ඇති මූලිකාංග හරහා දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය නිර්මාණය වී තිබේ.</u>

- <u>දේශපාලන විද්‍යාවේ විෂය අන්තර්ගතය පිළිබඳ විවිධ විවිධ කණ්ඩායම් වල අදහස්</u>

**RODDE** (රොඩ්) , **ANDERSON** (ඇන්ඩර්සන්) , **CHRISTOL** (ක්‍රිස්ටෝල්) , (**INTRODUCTION TO POLITICAL SCIENCE** ) <u>දේශපාලන විද්‍යාව හැඳින්වීම</u> කෘතිය තුළදී දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ කරුණු පහත පරිදි හකුලුවා දක්වයි.

1. රාජ්‍යයේ ආරම්භය හා වර්ධනය
2. තුලනාත්මක ආණ්ඩුක්‍රමය
3. ආණ්ඩුක්‍රම ආයතන : විධායකය , ව්‍යවස්ථාදායකය හා අධිකරණය
4. දේශපාලන ක්‍රියාදාමය , මැතිවරණ සහ නියෝජන ක්‍රම
5. නීතිය
6. සමාජ සම්බන්ධතා සහ අධ්‍යාපනය
7. රාජ්‍ය පරිපාලනය
8. දේශපාලන පක්ෂ , බලපෑම්කණ්ඩායම් සහ මහජනමතය
9. ජාත්‍යන්තර සම්බන්ධතා
10. දේශාපාලන හා න්‍යාය ධර්ම

1940 ගණන් වල්දී ඇමරිකානු දේශපාලන විද්‍යාඥයින්ගේ සංගමය විසින් දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ කරුණු පහත තේමාවන් යටතේ පෙළගස්වයි.

1. දේශපාලන න්‍යාය සහ සමාජ දර්ශනය
2. දේශපාලන පක්ෂ , බලපෑම් කණ්ඩායම් සහ මහජන මතය
3. ව්‍යවස්ථානුකූල නීතිය හා පරිපාලන නීතිය ඇතුළු පොදු නීතිය
4. රාජ්‍ය පරිපාලනය

5. රාජ්‍ය උපායමාර්ග , ජාත්‍යන්තර නිතිය හා ජාත්‍යන්තර සංවිධාන ඇතුළු ජාත්‍යන්තර සම්බන්ධතා

6. ජාතික ආණ්ඩුක්‍රමය

7. තුලනාත්මක ආණ්ඩු ක්‍රමය

8. ව්‍යවස්ථාදායකය හා නීති සම්පාදනය

9. විධායකය හා එහි කාර්යයන්

මේ අනුව දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ විෂය ක්ෂේත්‍රය සම්බන්දයෙන් සර්වලෝකී . . . , විශ්වීය . . . , පොදු එකඟතාවයක් නොමැති බවයි. **නමුත්** දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය ගොඩනැගී ඇත්තේ **රාජ්‍යය** කේන්ද්‍ර කොටගෙන බව පොදුවේ පිළිගත හැකි පරම සත්‍යකි.

---

## පොදුවේගත් කළ දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය තුළ හඳුනාගතහැකි කරුණු සංක්ෂිප්තව හඳුන්වාදිය හැකිය.

1. දේශපාලන න්‍යාය , දර්ශනය , චින්තනය , මතවාද
2. රාජ්‍ය හා ආණ්ඩුව.
3. දේශපාලන බලය.
4. දේශපාලන ක්‍රියාදාමය.
5. තුලනාත්මක ආණ්ඩු ක්‍රමය.
6. රාජ්‍ය පරිපාලනය , රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණය.
7. ගැටුම් ප්‍රබවය , ගැටුම් කළමනාකරණය , ගැටුම් නිරාකරනය.
8. අන්තර් ජාතික දේශපාලනය.
9. ප්‍රාදේශීය ආණ්ඩුකරනය.
10. නීතිය හා අධිකරණය.
11. ව්‍යවස්ථාදායකය හා නීති සම්පාදනය
12. විධායකය සහ එහි කාර්යයන්

## 1. දේශපාලන න්‍යාය , දර්ශනය , චින්තනය , මතවාද

දේශපාලන විද්‍යා ඇරඹියේ පටන් දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් ඉපැරණිම අංශය ලෙස මෙය විග්‍රහ කළ හැකිය.

**දේශපාලන න්‍යාය.**

දේශපාලන න්‍යාය යනු , ප්‍රත්‍යක්ෂ මූලික (තහවුරු කරගත්, යථාර්ථවාදී ) දත්ත සහ සාධක පදනම් කරගෙන දේශපාලන ආයතන වල ක්‍රියාකාරීත්ව සම්බන්ධයෙන් ගොඩනගා ඇති මූල ධර්මයන් ය.

**නිදර්ශන :** බලතල බෙදීමේ න්‍යාය , ව්‍යවස්ථානුකූලවාදය

**දේශපාලන දර්ශනය.**

දේශපාලන දර්ශනය යනු , දාර්ශනිකයන් විසින් ඉදිරිපත් කළ පරමාදර්ශනයන් ය. විවිධ දාර්ශනිකයන් විසින් නිර්මාණය වූවොත් හොඳයැයි කල්පනා කරමින් ඉදිරිපත් කළ මිහිපිට නිර්මාණය නොවූ පරමාදර්ශී කල්පිත තත්වයන්ය. දේශපාලන දර්ශනය නිසා දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය විශාල වශයෙන් වර්ධනය විය.

**නිදර්ශන :** ප්ලේටෝගේ පරමාදර්ශී රාජ්‍ය හා දාර්ශනික පාලකයා
රූසෝගේ පොදු කැමැත්ත
කාල් මාක්ස්ගේ විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය
තෝමස් මෝර්ගේ උටෝපියානු කොමියුනිස්ට් ක්‍රමය

**දේශපාලන චින්තනය.**

දේශපාලන චින්තනය යනු , දේශපාලන ක්‍රමයක සමස්ත ක්‍රියාකාරීත්වය සහ එයින් දේශපාලන ජීවිතයට වන බලපෑම පිළිබඳ ඒ ඒ කාලයන්හි ජීවත් වූ දේශපාලන චින්තයින් විසින් ඉදිරිපත් කර ඇති අදහස්ය.

**නිදර්ශන :**

| | | |
|---|---|---|
| ග්‍රීක යුගයේදී | - | සොක්‍රටීස් , ප්ලේටෝ , ඇරිස්ටෝටල් |
| රෝම යුගයේදී | - | සෙනෙකා , සිසරෝ , පොලිබීසියස් , . . . . . . |
| මධ්‍යතන යුගයේදී | - | ශාන්ත පෝල් , ශාන්ත ඔගස්ටීන් , . . . . . . . . |
| නූතන යුගයේදී | - | මැකියාවෙලි , ජෝන් ලොක් , තෝමස් හොබ්ස් . . . . . |

**දේශපාලන මතවාද.**

දේශපාලන මතවාද යන්නෙන් අදහස් කරනු ලබන්නේ ජීවිතය , සමාජය සහ ආණ්ඩුව පිළිබඳ සමස්ත සාමජය විසින් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් හෝ දේශපාලන පක්ෂ විසින් පිළිගෙන ඇති ඒකීය අදහස් මාලාවකි.

**නිදර්ශන :** ලිබරල්වාදී මතධාරීන් හා ලිබරල්වාදී පක්ෂ
මාක්ස්වාදී මතධාරීන් හා මාක්ස්වාදී පක්ෂ
ෆැසිස්ට්වාදී මතධාරීන්
රැඩිකල්වාදීන්

දේශපාලන න්‍යාය , දර්ශනය , චින්තනය , මතවාද වලට අදාල ඓතිහාසික කෘතීන් ලෙස ,

| | | | |
|---|---|---|---|
| ප්ලේටෝගේ | - | සමූහාණ්ඩුව | ( REPUBLIC ) |
| ඇරිස්ටෝටල්ගේ | - | දේශපාලනය | ( POLITICS ) |
| තෝමස් මෝර්ගේ | - | උටෝපියා | ( UTOPIA ) |
| මැකියාවේලිගේ | - | කුමාරයා | ( PRINCE ) |

## 2. රාජ්‍ය හා ආණ්ඩුව

දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ ඇති කේන්ද්‍රීය මාතෘකාව වන්නේ **රාජ්‍ය හා ආණ්ඩුවයි.** දේශපාලන විද්‍යාව ක්‍රි.පූ. 3 දී ග්‍රීසිය තුළ උත්පාදවන්නේ රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ සංවාදයක් ලෙසිනි. අනතුරුව **රෝම , මධ්‍යතන , නූතන** අවධිය තෙක්ම රාජ්‍ය හා ආණ්ඩුව දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ ප්‍රධාන කතිකාව බවට පත්වෙයි. එම නිසා **දේශපාලන විද්‍යාව රාජ්‍ය පිළිබඳ විද්‍යාව** වන බවට මතයක් පවතියි. එය **දේශපාලන විද්‍යාවේ සාමාන්‍ය න්‍යාය** ලෙස හඳුන්වයි.

**"ග්‍රීක අවධිය"** තුළදී රාජ්‍ය හා ආණ්ඩුව සම්බන්ධ කථිකාවත පෝෂණය කළ දාර්ශනිකයන් ලෙස , ප්ලේටෝ , ඇරිස්ටෝටල් ද **"රෝම යුගය"** තුළදී පොලිබීසියස් , සිසරෝ , සෙනෙකා ද **"මධ්‍යතන"** අවධියේදී ශාන්ත ඔගස්ටීන් , ශාන්ත පෝල් , ශාන්ත තෝමස් ඇක්වයිනාස් ද **"නූතන"** අවධිය තුළ ජෝන් ලොක් , චාල්ස් මොන්ටෙස්ක්‍යු , මැකියාවේලි , ජීන් බොඩෑන් ආදීහු පෙන්වා දිය හැකිය.

<u>හේතු</u>

මිනිසාට උපරිම වශයෙන් භෞතික දියුණුවක් සාක්ශාත් කර ගත හැකි වඩා හොඳ රාජ්‍ය ක්‍රමය කුමක්ද යන්න සිදුකළ අධ්‍යයනයන් නිසා රාජ්‍යය හා ආණ්ඩුව කේන්ද්‍රීය තේමාවක් බවට පත් විය.

<u>ග්‍රීක අවධියේ පටන් නූතන අවධිය දක්වා "රාජ්‍ය හා ආණ්ඩුව" පිළිබඳ තේමාවට අදාළව අවධානය යොමුකළ අංශ</u>

- රාජ්‍යයේ ප්‍රභවය
- රාජ්‍යයේ අනාගතය
- රාජ්‍යයේ කාර්ය භාරය
- රාජ්‍යය හා පුද්ගලයා අතර ඇති සම්බන්ධතාවය
- රාජ්‍යයේ බලයට අවනත විය යුතු ද නැද්ද යන්න
- රාජ්‍යයේ ස්වභාවය
- රාජ්‍යයේ අරමුණු

<u>රාජ්‍ය හා ආණ්ඩුව දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය තේමාව නිසා දාර්ශනිකයන් ඒ සම්බන්දයෙන් දක්වා ඇති අදහස් කිහිපයකි.</u>

**"දේශපාලන විද්‍යාව රාජ්‍ය පිළිබඳ විද්‍යාව වේ."**

-රේමන් ජී. ගෙට්ල්-

**"දේශපාලන විද්‍යාව රාජ්‍යයෙන් ආරම්භවී රාජ්‍යයෙන් අවසන් වේ."**

-මහාචාර්ය ගානර්-

**"රාජ්‍යයේ පදනම සහ ආණ්ඩුවේ මූලධර්ම අධ්‍යනය කිරීම සමාජ විද්‍යාවක් වශයෙන් දේශපාලන විද්‍යාව සතු කාර්යභාරයකි."**

-පෝල් ජෙනට්-

**"රාජ්‍යය හා එහි වර්ධනය සඳහා අවශ්‍ය සියළුම කොන්දේසි සලකා බැලීම දේශපාලන විද්‍යාව මගින් කරුණු ලැබේ."**

-ඇක්ටන් සාමි-

ග්‍රීක අවධියේ සිට නූතන අවධිය දක්වා රාජ්‍යය පිළිබඳ තේමාව පෝෂණය කළ දාර්ශනිකයන්

| | | |
|---|---|---|
| ග්‍රීක අවධිය | - | සොක්‍රටීස් , ප්ලේටෝ , ඇරිස්ටෝටල් |
| රෝම යුගය | - | සිසරෝ , සෙනෙකා , පොලිබීසියස් |
| මධ්‍යතන යුගය | - | ශාන්ත පෝල් , ශාන්ත ඔගස්තීන් ...... |
| නූතන යුගය | - | ජෝන් ලොක් , රූසෝ , මොන්ටෙස්ක්‍යු ...... |

රාජ්‍යය පිළිබඳ තේමාවට අදාළ පදනම් ග්‍රන්ථ

| | | | |
|---|---|---|---|
| පාලකයා , සමූහාණ්ඩුව | - | ප්ලේටෝ | ග්‍රීක යුගය |
| දේශපාලනය , ඇතැන්ස්හි ව්‍යවස්ථාව | - | ඇරිස්ටෝටල් | |
| නීතිය | - | සිසරෝ | රෝම යුගය |
| ලෞකික ආණ්ඩුව | - | මාටින් ලූතර් | මධ්‍යතන යුගය |
| දෙවියන්ගේ නගරය | - | ශාන්ත ඔගස්තීන් | |
| සමාජ සම්මුතිය | - | රූසෝ | නූතන යුගය |
| නීතියේ සාරය | - | චාල්ස් මොන්ටෙස්ක්‍යු | |
| සිවිල් ආණ්ඩුව | - | ජෝන් ලොක් | |

## 3. දේශපාලන බලය

නව යුගය තුළ දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළට එකතු වූ නව තේමාව බලය වශයෙන් හැඳින්විය හැකිය.

හැඳින්වීම

බලය යනු ,

පොදු නිර්වචන

"බලය හසුරුවන අයට තමන් කැමති ආකාරයට බලයට යටත් අය පාලනය කිරීමට ඇති හැකියාව තම කැමැත්තට අවනත නොවන විට බලකිරීම මගින් අවනතභාවය ලබා ගැනීමට ඇති හැකියාවයි."

-දාර්ශනික නිර්වචන-

"දේශපාලන බලය යනු ආර්ථික සංවර්ධනය ප්‍රහාර වලින් ආරක්ෂාවීම , නීතය හා සාමය පවත්වාගෙන යාම , ආදී සාමූහික අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා පුරවැසියන් මත පතිත කරන ආණ්ඩුවේ ශක්‍යතාවයයි."

-ටැල්කොට් පර්සන්-

හේතු

15 , 16 සියවස් තුළදී දේශපාලන බලය සම්බන්ධ තේමාව දේශපාලන විද්‍යාවට එක්වීම සම්බන්ධයෙන් බලපෑ වාස්තවික හේතු සාධක කිහිපයකි.

## ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය හා වර්ධනය

ජාතික රාජ්‍යයන්ට ස්වකීය අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහාත්, ජාතික ආරක්ෂාව පවත්වාගැනීම සඳහාත් , ජාත්‍යන්තරය තුළ බලවත් ජාතික රාජ්‍යයක්වීම ලෙස ඉස්මතුවීම සඳහාත් සඳහාත් අවශ්‍ය කේන්ද්‍රීය සාධකයක් බවට බලය පත්විය. එම නිසා දේශපාලන විද්‍යාව තුළ දේශපාලන බලය සම්බන්ධ තේමාව එකතු විය.

## ස්වාධිපත්‍ය සංකල්පය

ජාතික රාජ්‍යයක් බවට පත්වීම සඳහා ස්වාධිපත්‍ය බලය අත්‍යවශ්‍යය ප්‍රධාන මූලධර්මයක් බවට පත්ව තිබේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ස්වාධිපත්‍යය යනු රාජ්‍ය නිර්මාණයවීමට අදාළ සංයුතික මූලධර්මය යි.

බලයට අදාළව දේශපාලන විද්‍යාව තුළ අවධානය යොමු කරනු ලබන අංශ

- බලය යනු කුමක්ද?
- බලය උත්පාද වන්නේ කෙසේද?
- බලයේ ස්වභාවය කුමක්ද?
- බලය අත්පත් ගන්නේ කෙසේද?
- බලය පවත්වාගන්නේ කෙසේද?
- බලය ක්‍රියාවට නංවන්නේ කෙසේද?
- බලයට විරුද්ධව නැගී සිටින්නේ කෙසේද?
- බලය බෙදනු ලබන්නේ කෙසේද?

නූතන අවධිය තුළ බලය සම්බන්ධ අදහස් දැක්වූ දාර්ශනිකයන්

( මැකියාවේලි , තෝමස් හොබ්ස් , මැක්ස් වෙබර් , හැරල්ඩ් ජේ ලැස්කි , බිස්මාක් , නියෙට්ශේ )

බලය සම්බන්ධ අදහස් අන්තර්ගත ග්‍රන්ථ

**කුමාරයා කෘතිය තුළ අන්තර්ගත බලවාදී ඉගැන්වීම් [මතවාදයන්]**

"දේශපාලනය යනු බල අරගලයකි."

" බලය අල්ලා ගැනීම සඳහා පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් අතර පවතින අරගලය දේශපාලනය වේ."

"පාලකයා ස්වකීය පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා විටෙක හිවලෙකු මෙන් කපටි විය යුතු ය. විටෙක සිංහයෙකු මෙන් නිර්භීත විය යුතුය. "

"බලයට අල්ලාගැනීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රියාමාර්ගයේ සුජාතභාවය ප්‍රශ්නයක් නොවන අතර වැදගත් වන්නේ බලය අල්ලාගැනීම පමණි. "

"දේශපාලනයේ (බල අරගලයේ) වැදගත් සාධක කිහිපයකි."

**(i)** බලය අල්ලා ගැනීම.

**(ii)** බලය තහවුරු කරගැනීම.

**(iii)** බලය ව්‍යාප්ත කිරීම.

**ලෙවියාතන් කෘතිය තුළ අන්තර්ගත බලවාදී ඉගැන්වීම් [මතවාදයන්]**

| |
|---|
| "මිනිසාගේ ස්වභාවය වන්නේ බලය වෙනුවෙන් බලය පසුපස දිව යාමයි. එය අවසන් වන්නේ මරණයෙන් පසුවයි.<br>-තෝමස් හොබ්ස්-<br>(Leviathan ) |

## 4. දේශපාලන ක්‍රියාදාමය

20 වැනි සියවස තුළදී චර්යාවාදී විධික්‍රමය හරහා දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට එකතු වූ සංවාදයක් ලෙස දේශපාලන ක්‍රියාදාමය හැඳින්විය හැකිය.

හැඳින්වීම

| |
|---|
| **දේශපාලන ක්‍රියාදාමය යනු ,**<br>**සංවිධානය වූ දේශපාලන ක්‍රමයක් තුළ දේශපාලන බලධාරී ආයතන හා මහජනතාව එකට සම්බන්ධ කරන උපාංග ක්‍රියා පිළිවෙතයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ආණ්ඩුකරණය සඳහා ජනතාව සම්බන්ධ වන සමස්ත ක්‍රියාවලිය යි.** |

හේතු

20 වැනි සියවස තුළ දේශපාලන ක්‍රියාදාමය පිළිබඳ තේමාව චර්යාවාදීන් විසින් දේශපාලන විද්‍යාවට එක් කරයි. ඒ සඳහා බලපෑ වාස්තවික හේතු සාධක

ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම් වර්ධනයවීම.

ප්‍රජාතන්වාදී මතවාදී ඇරඹිය 17 වැනි සියවස තුළ සිදුවිය. 20 වන සියවස තුළ එය තව දුරත් ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම් වර්ධනය හා ව්‍යාප්තිය සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස දේශපාලන ක්‍රියාදාමය දැක්විය හැකිය.

දේශපාලන ක්‍රියාදාමයට අදාළ උපාංග

- දේශපාලන සමාජානුයෝජනය
- දේශපාලන සංස්කෘතිය
- දේශපාලන ප්‍රභූන්
- දේශපාලන නවීකරණය
- දේශපාලන සංවර්ධනය
- දේශපාලන ප්‍රචණ්ඩත්වය
- නියෝජන හා මැතිවරණ
- දේශපාලන පක්ෂ
- සිවිල් සමාජය
- මහජන මතය
- සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම

## 5. තුලනාත්මක ආණ්ඩු ක්‍රමය.

තුලනාත්මක ආණ්ඩුක්‍රමය දේශපාලන විද්‍යාවේ ඉතා පැරණි සංකල්පයක් වේ. ග්‍රීක අවධිය තුළදී ඇරිස්ටෝටල් විසින් ග්‍රීක පෞර රාජ්‍ය 158 ක් තුලනාත්මකව අධ්‍යයනය කරමින් දේශපාලනය ( POLITICS ) කෘතිය රචනා කළේය. තුලනාත්මක විධි ක්‍රමයේ පියා ඇරිස්ටෝටල් ය.

වර්තමානය තුළද තුලනාත්මක විධි ක්‍රමය භාවිතා කරයි. ආණ්ඩු ක්‍රම , දේශපාලන ආයතන , නීති තුලනාත්මකව සංසන්දනය කිරීම මගින් වඩා හොඳ ආණ්ඩුක්‍රමයක් වඩා හොඳ දේශපාලන ආයතන , වඩා හොඳ නීති පද්ධතියක් නිර්මාණය කර ගැනීමට අවකාශයට ලැබේ.

## 6. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

නූතන අවධිය තුළ දේශපාලන විද්‍යාවට එකතු වූ නව තේමාවක් ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හඳුනාගත හැකිය.

හැඳින්වීම

**රාජ්‍ය ප්‍රතිපත්ති යනු ,**

**රාජ්‍යය නීති පනවන විටත් , නීති ක්‍රියාත්මක කරන විටත් ,අනුශාසනා කරන විටත් අනුගමනය කරන දේ රාජ්‍ය ප්‍රතිපත්ති නම් වේ.**

හේතු

18 - 19 සියවස් තුළ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා කලමනාකරණය පිළිබඳ කතිකාව , සංවාදය දේශපාලන විද්‍යාවට එක්වීම සම්බන්දයෙන් බලපෑ හේතු ,

සුභසාධන රාජ්‍යය ක්‍රමයේ ආරම්භය හා වර්ධනය

නීතිය හා සාමය ආරක්ෂා කිරීම පමණක් රාජ්‍යයේ කාර්යභාරය කරගත් නිර්බාධවාදී පොලිස් රාජ්‍යය බිඳ වැටීම සමඟ නීතිය හා සාමය ආරක්ෂා කරනවාට අමතරව සුභසාධනය පදනම් කරගත් සුභසාධනවාදී රාජ්‍ය ක්‍රමය ආරම්භය හා ව්‍යාප්තිය සිදුවිය. සුබසාධනය ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍යයට නව ප්‍රතිපත්ති නිර්මාණය කිරීමට සිදුවිය. **අධ්‍යාපන ප්‍රතිපත්ති , සෞඛ්‍ය ප්‍රතිපත්ති , ප්‍රවාහන ප්‍රතිපත්ති , යටිතල පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති** , ආපදා කළමණාකරණය පිළිබඳ ප්‍රතිපත්ති නිදර්ශන ලෙස දැක්විය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස දේශපාලන විද්‍යාවට රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණය සම්බන්ධ තේමාව එක් විය.

දෙවන ලෝක සංග්‍රාමය

1939 - 1945 අතර කාලය තුළ සිදුවූ දෙවන ලෝක සංග්‍රාමය නිසා රාජ්‍යයන් තුළ විශාල මිනිස් ජීවිත ප්‍රමාණයක් හා භෞතික සම්පත් ප්‍රමාණයක් විනාශ විය. නිදසුන් ලෙස දළ වශයෙන් **දෙවන ලෝක මහා සංග්‍රාම නිසා විනාශවී ගිය මිනිස් ජීවිත සංඛ්‍යාව හාරකෝටි හැත්තෑ ලක්ෂයකට අධික විය. එමෙන්ම ජර්මනිය ප්‍රංශය , රුසියාව , බ්‍රිතාන්‍ය , පෝලන්තය , ජපානය වැනි රාජ්‍යයන් හි විශාල භූමි ප්‍රදේශයක් හා නගර සුන්බුන් බවට පත්විය.**

දෙවන ලෝක මහා සංග්‍රාමය සමඟ කඩා වැටුනු රාජ්‍යයන් යළි සංවර්ධනය කිරීමට අවශ්‍ය වූ අතර ඒ සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණ යන අංශ වැදගත් විය. මෙම අංශය දේශපාලන විද්‍යාවට එක්වීම හරහා දේශපාලන විද්‍යාව තවදුරටත් විකාශනය විය.

<u>තුන්වන ලෝකයේ රාජ්‍යයන් බිහිවීම. (නව රාජ්‍යයන් නිර්මාණය වීම.)</u>

දෙවන වන ලෝක මහා සංග්‍රාමයට පශ්චාත් කාලීන අවධිය තුළ යටත් විජිත හරණය සිදු විය. එහි ප්‍රතිපලයක් ලෙස <u>ආසියානු</u> , <u>අප්‍රිකානු</u> , <u>ලතින් ඇමරිකානු</u> කලාපය තුළ ජාතික රාජ්‍යයන් නිර්මාණය විය. එම රාජ්‍යයන් තෙවන ලෝකයේ රාජ්‍යයන් ය. නවරාජ්‍යයන් යනු ඒවාට අන්වර්ථ නාමයකි.

<u>රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය , ක්‍රියාත්මක කිරීම පියවර කිහිපයක් යටතේ සිදුවේ.</u>

(a) **පළමු පියවර - රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රාරම්භය**
මෙහිදී ප්‍රතිපත්ති නිර්මාණය කළ යුතු ගැටලුව හඳුනා ගැනීම සිදු වේ.

(b) **දෙවන පියවර - ප්‍රතිපත්ති නිර්මාණය කිරීම.**
මෙහිදී ගැටලුවට අදාළව ඉදිරිපත් කළ හැකි හොඳම ප්‍රතිපත්තිය නිර්මාණය කිරීම සිදු කරයි.

(c) **තෙවන පියවර - ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.**
මෙහිදී නිර්මාණය කළ ප්‍රතිපත්තිය ක්‍රියාවට නගයි. මෙය සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන අංශය මගිනි.

(d) **සිව් වන පියවර - ප්‍රතිපත්ති ඇගයීම කිරීම.**
මෙහිදී ක්‍රියාත්මක වන කරනු ලැබූ ප්‍රතිපත්තියේ සාර්ථක , අසාර්ථකභාවය ඇගයීමට ලක් කරයි.

## 7. <u>රාජ්‍ය පරිපාලනය</u>

දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට මෑතකදී එකතු වූ නව තේමාවක් ලෙස "රාජ්‍ය පරිපාලනය" දැක්විය හැකිය.

<u>හැඳින්වීම</u>

**රාජ්‍ය පරිපාලනය යනු ,**

**රාජ්‍ය පාලනය සඳහා වෘත්තීමය නිල බල පැලැන්තියක සේවය ලබා ගැනීමයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් වෘත්තීමය නිලබල පැලැන්තියක් මගින් රාජ්‍ය පාලන කටයුතු සිදු කිරීමයි.**

<u>හේතු</u>

සුබසාධන රාජ්‍ය ක්‍රමය.

කාර්මික ධනවාදයේ ආරම්භය.

දෙවන ලෝක මහා සංග්‍රාමය.

නව රාජ්‍යයන් බිහිවීම.

සුඛසාධන රාජ්‍යය ක්‍රමයේ වර්ධනය

සුඛසාධන රාජ්‍යය ක්‍රමයේ වර්ධනයත් සමඟ රාජ්‍ය ආර්ථික හා සමාජමය කටයුතු වලට විශාල වශයෙන් මැදිහත් වූ අතර රාජ්‍ය ප්‍රතිපත්ති ජනතාව අතර ක්‍රියාවට නැංවීමට රාජ්‍ය පරිපාලනය නිර්මාණය වීය.

දෙවන ලෝක මහා සංග්‍රාමය

දෙවන ලෝක මහා සංග්‍රාමය සමඟ බිඳ වැටුනු රාජ්‍ය යළි නිර්මානය කිරීමට අවශ්‍යවීම ද රාජ්‍ය පරිපාලන වර්ධනයට බලපෑම් කළේය. තව දුරටත් නව රාජ්‍යයන් බිහිවීම කාර්මික ධනවාදයේ ව්‍යාප්තිය රාජ්‍ය පරිපාලනය වර්ධනයවීම හා ශක්තිමත්වීම කෙරෙහි හේතු විය. වර්තමානය වන විට රාජ්‍ය පරිපාලනය දේශපාලන විද්‍යාව විෂය ක්ෂේත්‍රය තුළ වැදගත් තේමාවක් බවට පත්ව ඇත.

රාජ්‍ය පරිපාලනයට අදාල අංගයන්

**සංවිධාන න්‍යාය** **(පරිපාලන ආයතන සංවිධානය කිරීම පිළිබඳ මූලධර්ම පද්ධතිය)**

**නිලබල ක්‍රමය** **(රාජ්‍ය සේවකයින් බඳවා ගැනීම , පුහුණු කිරීම සහ සේවක පරිපාලනයේ විවිධ අංශයන් මීට අදාළ වේ.)**

**මූල්‍ය කළමනාකරණය**
**මහජන සම්බන්ධතා පවත්වා ගැනීමේ ක්‍රම**
**පොදු ප්‍රතිපත්ති සම්පාදනය**
**පරිපාලන නීති**
**තුලනාත්මක පරිපාලනය**
**සංවර්ධන පරිපාලනය**

## 9. ගැටුම් ප්‍රභවය , ගැටුම් කළමනාකරණය හා ගැටුම් නිරාකරණය

ගැටුම් ප්‍රභවය කලමණාකරණය හා නිරාකරණය නව යුගය තුළ දේශපාලන විද්‍යාව විෂය ක්ෂේත්‍රයට එක් වූ තේමාවකි.

හැඳින්වීම

ගැටුම් අර්ථකතනය

පුද්ගලයන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් අතර පුද්ගල කණ්ඩායම් දෙකක් හෝ කිහිපයක් අතර රාජ්‍ය දෙකක් හෝ රාජ්‍යයන් කිහිපයක් අතර ඇතිවන එකඟනොවීමක් හෝ කළහකාරී තත්ත්වයක් ගැටුමක් ලෙස සරලව අර්ථකතනය කළ හැකිය.

හේතු

18 - 19 සියවස් තුළදී ගැටුම් අධ්‍යනය හා නිරාකරණය පිළිබඳ තේමාව දේශපාලන විද්‍යාවට එකතුවීම සම්බන්දයෙන් බලපෑ වාස්තවික හේතු සාධක ,

ජාතික රාජ්‍ය තුළ ඇතිවන වාර්ගික ගැටුම් ,

විශේෂයෙන් තුන්වන ලෝකයේ නව රාජ්‍යයන් තුළ මෙම වාර්ගික ගැටුම් උත්සන්න වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දේශපාලන විද්‍යාව තුළ ගැටුම් වැදගත් මාතෘකාවක් බවට පත්විය. මෙම තත්වයන් නිසා දේශපාලන විද්‍යාව ගැටුම් අධ්‍යයනය හා නිරාකරණය පිළිබඳ විද්‍යාවක් ලෙස ද මතයක් වේ.

ලෝක මහා සංග්‍රාම ,


1914 - 1918 අතර පැවති පළමු ලෝක මහා සංග්‍රාමයත් 1939 - 1945 අතර පැවති දෙවන ලෝක මහා සංග්‍රාමය නිසාත් ගැටුම් අධ්‍යනය හා නිරාකරණය සම්බන්ධ උනන්දුව වර්ධනය විය. ඒ හරහා රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට දේශපාලන විද්‍යාඥයින් , දාර්ශණිකයින් , චින්තකයින් අතර උනන්දුවක් ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගැටුම් යන අංශය දේශපාලන විද්‍යාවට එක්විය.

ගැටුම් වලට අදාළ ලෝක ඉතිහාසයේ ඇති ශක්තිවන්ත නිදර්ශන

| | |
|---|---|
| පළමුවන ලෝක යුද්ධය | (1914 - 1918 ) |
| දෙවන ලෝක යුද්ධය | (1939 - 1945) |
| රුසියානු විප්ලවය | (බොල්ශෙවික් විප්ලවය) 1917 |
| ඇමරිකානු විප්ලවය | (1776) |
| ප්‍රංශ විප්වලය | (1789) |

"ජොහාන් ගැල්ටුන්ගේ" විසින් "ගැටුම් ත්‍රිකෝණයක්" හඳුන්වා දෙයි. මෙම ගැටුම් ත්‍රිකෝණය මගින් ගැටුම් සම්බන්ධව

- ව්‍යූහය
- ආකල්ප
- චර්යා සම්බන්ධයෙන් අවධානයට ලක්කර ඇත.




ගැටුම් සම්බන්ධ කතිකාවත තුළ වැදගත් තේමාවන් කිහිපයකි.

| | | |
|---|---|---|
| 1. | ගැටුම් වැළැක්වීම. | (ගැටුම් ඇතිවීමට පෙර වළක්වා ගැනීම මිනි අර්ථවත් වේ.) |
| 2. | ගැටුම් සමථකරණය | (ගැටුම් ප්‍රචන්ඩකාරී නම් එය සමනය කිරීම ගැටුම් සමථකරණය වේ. ගිවිසුම් වලට එළඹීම, සම්බාධක පැනවීම මෙයට භාවිතා කරනු ලබන උපක්‍රමයන් වේ.) |
| 3. | ගැටුම් කළමනාකරණය | (ගැටුම් ව්‍යාප්තිවීම වැළැක්වීම ගැටුම් කළමනාකරණය නම් වේ) |
| 4. | ගැටුම් නිරාකරණය | (ගැටුම් අවසන් කිරීම මින් අර්ථවත් වේ. යුද්ධ කිරී මගින් හෝ සමකාමී ක්‍රියාමාර්ග මගින් ගැටුම් නිරාකරනය සිදු කරයි. |
| 5. | ගැටුම් විපරිවර්තනය | ( ගැටුම ඇතිවීමට බලපෑ තත්වයන් සොයා බලා එම තත්වයන් නිශේධනය කිරීමයි) |

## 9. අන්තර් ජාතික දේශපාලනය

අන්තර් ජාතික දේශපාලනය ද නව යුගය තුළ දේශපාලන විද්‍යාවට එකතු වූ නව තේමාවක් ලෙස හඳුනාගත හැකිය.

හැඳින්වීම

**අන්තර්ජාතික දේශපාලනය යනු ,**

**ජාතීන් අතර සිදුවන දේශපාලනය යි. ජාත්‍යන්තර දේශපාලනය ලෙස ද මෙය හඳුන්වයි.**

හේතු :

19 - 20 සියස් තුළදී අන්තර් ජාතික දේශපාලනය පිළිබඳ තේමාව දේශපාලන විද්‍යාවට එක් වීම සම්බන්ධයෙන් බලපෑ වාස්තවික හේතු සාධක ,

ජාතික රාජ්‍යය ක්‍රමය ආරම්භය හා ව්‍යාප්තිය

15 - 16 සියවස් වල ඇරඹි ජාතික රාජ්‍ය ක්‍රමය 19 - 20 වැනි සියවස් වන විට ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් ජාතික රාජ්‍යයන් 200 කට ආසන්න සංඛ්‍යාවක් නිර්මාණය විය. ජාතික රාජ්‍යය ක්‍රමය වර්ධනය සමඟ අන්තර්ජාතික දේශපාලනය සම්බන්ධ අවධානය පුළුල් විය. එයට හේතු වූයේ සෑම ජාතික රාජ්‍යය ජාත්‍යයන්තරය තුළ බලවත් රාජ්‍යයක් වීමට උත්සාහ දැරීමයි.

කිසිඳු ජාතික රාජ්‍යයකටම හුදකලා චලනයක් නොමැතිවීම.

වර්තමානයේ කිසිඳු ජාතික රාජ්‍යයකට කේවල පැවැත්මක් නොමැත. එම නිසා ජාතීන් අතර දේශපාලනය වැදගත් සාධකයක් බවට ගොඩනැගීම.

ජාතික දේශපාලනය හා අන්තර්ජාතික දේශපාලනය අන්තර් පෝෂණයක් පැවතීම.

ජාතික දේශපාලනය හා අන්තර් ජාතික දේශපාලනය අතර සෘජු සම්බන්ධතාවයක් පවතී. එම නිසා ජාතික රාජ්‍ය ක්‍රමය වර්ධනය වීමත් සමඟ අන්තර්ජාතික දේශපාලනය නිර්මාණයට අදාළ තත්වයන් පිහිටීම.

අන්තර් ජාතික දේශපාලනයේදී වැදගත් "රඟුම් කරුවන්" කිහිප දෙනෙකි.

( රාජ්‍යය , රාජ්‍ය සංවිධාන , රාජ්‍ය නොවන සංවිධාන , බහු ජාතික සමාගම් , බලපෑම් කළ හැකි පුද්ගලයන් )

අන්තර් ජාතික දේශපාලනය ක්‍රියාත්මක වන්නේ මාර්ග දෙකක් මතය,

1. **සාමකාමී උපක්‍රමය**
   නිදර්ශන - තානාපති සේවය , ආර්ථික බලය , රාජ්‍ය ඔත්තුකරුවන් ,රහස් ඔත්තුසේවාවන් , සාකච්ඡාව

2. **යුධමය උපක්‍රමය**

ජාත්‍යන්තර දේශපාලනය තුළ රාජ්‍යයේ නිදහස චලනයන් කෙරෙහි බලපාන සීමාවන් හඳුනාගත හැකිය. ඒවා නම් ,

**අන්තර්ජාතික සංවිධාන**
**අන්තර් ජාතික නීතිය**
**අවි ආයුධ පාලනය**
**නිරායුධකරණය**

## 10. නීතිය හා අධිකරණය

නීතිය හා අධිකරනය ද දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ අඩංගු තවත් මාතෘකාවකි. මීට අදාළව , නීතිය යනු කුමක් ද? නීති මූලාශ්‍ර මොනවාද? නීති වර්ග මොනවාද? නීතියේ ආධිපත්‍ය යනු කුමක්ද? යන්න සාකච්ඡා කරනු ලබයි.

තව දුරටත් ,

අධිකරණය යනු කුමක්ද? අධිකරණයේ කාර්යභාරය කුමක්ද? අධිකරණ වර්ග මොනවාද? අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද? යන්න සාකච්ඡා කරනු ලබයි.

## 11. ව්‍යවස්ථාදායකය හා නීති සම්පාදනය

නූතන ආණ්ඩුක්‍රම තුළ ව්‍යවස්ථාදායක සභා ගොඩනගා ඇති ආකාරය , කාර්යය හා බලතල , නව ප්‍රවනතා මේ යටතේ සලකා බලනු ලැබේ.

## 12. විධායකය හා එහි වැඩකටයුතු

නූතන ආණ්ඩුක්‍රමය තුළ විධායකය ගොඩනගා ඇති ආකාරය , විධායක වර්ග , කාර්ය හා බලතල , නව ප්‍රවනතා මේ යටතේ සලකා බලනු ලැබේ.